# කපු කමයි ගැම් කමයි




අපේ ගෙදරට උඩින් ගෙදර ලිහිනිස් ආතලාගේ ගෙදර ය. බට වරිච්චි බිත්තියට කටුමැටි ගසා අතින් සිනිදුවට තුනීකොට කිරිමැටි දිය කර සාදා ගත් සුදු තීන්තවලින් බිත්ති සුදු පිරියම් කර ඇති ගෙය එක දිගට සෑදූ කෑලි තුනකින් යුතු ය. ගෙට ගොඩ වන්නේ මැද කෑල්ලට ය. එය නිවසේ සාලය යි. වම් අත පැත්තේ කාමරයකි. දකුණු අත පැත්තේ කුස්සිය යි. බිමට ගොම මැටි අතුල්ලා තිබුණු අතර දුඹුරු පැහැ වූ අඟල් පහක පමණ තීන්ත පටියක් බිත්ති දිගේ පහළ තීරුවේ මුළු ගෙය පුරා ම සායම් කොට තිබුණි. වහල සෙවිලි කොට තිබුණේ වියන ලද පොල්අතු වලිනි. පීප් රාළහාමි කුලියට ගෙන පදිංචිව සිටි අතුරේ ඇල්බට් මුදලාලිගේ නිවසට සහ ඇඳි පාලමට පහළින් ඇති අපේ නිවස අතර ලිහිනිස් ආතාගේ නිවස පිහිටා ඇත. අපේ ලිහිනිස් ආතාගේ නිවසේ පිරිස වූයේ ඔහුගේ බිරිඳ වන එමානෝනා ආච්චි, වැඩිමලා මෙන් ම එක ම පිරිමියා වූ මහතුන් මාමා, කරුණාවතී පොඩිඅම්මා, ලිලී පොඩි අම්මා සහ පවුලේ බාලයා වූ දිසිලින් පොඩිඅම්මාත් ය. තවත් මහතුන් මාමාට වැඩි මහල් ලොකුඅම්මා කෙනෙකු සිටි බවක් පැවසෙතත් ඇයව මා කිසි දිනක දැක නැත. ඇය සෝමපාල අයියාගේ සහ සුදු අක්කාගේ අම්මා ය. සෝමපාල අයියා මෙලොව එළිය දැකීමේ දී වැළඳුණු වැදූගෙයි සන්නිය නමැති අසනීපයෙන් ඇය මියගිය බව කියනවා මා අසා ඇත. අපේ වයසේ සෝමපාල අයියා ද එම නිවසේ ම සිටියේ ය. මහතුන් මාමා ළඟ තිබුණු ග්‍රෑමපෝනයෙන් සින්දු ඇසීමට පුංචි අප ආසා කළ අතර ඒ සඳහා අපි නිතර ම එම නිවසට ගියෙමු. මහතුන් මාමාගේ අත් පියානෝවක් සහ මැන්ඩලින් එකක් ද තිබුණු අතර ඒවා වාදනය කළේ ද මහතුන් මාමා ම ය.

ලිහිනිස් ආතා නිවුන්නුන් දෙදෙනෙකුගෙන් කෙනෙකි. එක ම හැඩරුව, එක වාගේ ම ඇඳුම සහ එක ම ජීවන වෘත්තිය කළ දෙදෙනෙකු වූ ඔවුන්ගේ අනෙක් ආතාගේ නම ලියෝරිස් ය. ලියෝරිස් ආතා ජීවත් වූයේ ගෝවින්නෙන් හැරී යන විට හමුවන වෙරළුගස් තොටුපළ ආසන්නයේ රැටියල නම් ගමේ ය. මේ දෙදෙනාගේ ප්‍රධාන ජීවන වෘත්තිය වූයේ මඟුල් කපුකම් කිරීම ය. සුදු කොටු සරම සහ කළු පාට කෝට් එක ප්‍රධාන ඇඳුම ය. ලිහිනිස් ආතා සරොම් දෙකක් අඳින අතර පළමු සරම ඇඳීමට කලින් කම්බි ලේන්සුවක-න් අමුඩයක් ගැසීම පුරුද්ද ය. අමුඩයට උඩින් එක සරමක් තරමක් කොටට ද ඊ ළඟට සුදු කොටු සරම ඇඳ හවඩිය බැඳ කළු කෝට් එක ඇඳ කළු පාට කුඩය අතට ගත් විට නිල ඇඳුම පැළඳි නියම මඟුල් කපුවා මතුවෙයි. කෝට් එකේ සාක්කු කීපයකි. එම සාක්කුවල කේන්දර කොපි හතඅටක් වරදින්නේ ම නැත. සමහර විට පුස්කොළයෙන් සාදන ලද කේන්ද්‍ර ද එම සාක්කුවලින් මතුවෙයි. ලිහිනිස් ආතා මඟුල් ගමනක් ගොස් නිවසට පැමිණ මුලින් ම ගලවන්නේ කෝට් එක ය. කෝට් එක මිදුලේ දී ම ගලවා මිදුලේ ඇද ඇති රෙදි වැලෙන් දමයි. ඊ ළඟට උඩ සරම සහ ඇඳ ඇති බැනියම ගලවා එම රෙදි වැලට ම දමයි. යටට ඇඳ ඇති සරම ගලවා රෙදි වැලට දැමූ විට නිවසට අඳින ඇඳුම ඔහු ඇඳගෙන ය. ඒ අමුඩය ය. නිවසේ සිටින විට කිසි ම දිනක අමුඩය මිස සරමක් හෝ වෙනයම් ඇඳුමක් අඳින්නේ ම නැත.

ඕනෑ ම වැඩකට සූරයෙකු වූ ලිහිනිස් ආතා සතු ආයුධ කට්ටලයකි. එහි තිබෙන ප්‍රධාන ආයුධ වන්නේ වෑය සහ පොරවයි. වෑයෙන් ඉතා සියුම්ව ලී ගෑමට මනා පුහුණුවක් ඇති ඔහු උළුවස්සක්, ජනේලයක් වුව ද සෑදීමට ලීය සියුම්ව වෑයෙන් ගා ගැනීමට දක්ෂ ය. එවකට බොහෝ දෙනා සාදා ගනු ලබන කටුමැටි ගෙවල් සාදා දීමට බාරගන්නා ඔහු ඒ සඳහා කිසියම් වූ මුදලක් අය කරයි. ගෙයි අත්තිවාරමේ සිට වහලයේ අතු සෙවිල්ල දක්වා කරන්නේ තනි මහන්සියෙනි. කාමර කිහිපයක නිවසක් වුවත් සති දෙක තුනකින් නිම කිරීමේ හැකියාව ඔහු සතු ය.

නිවස සෑදීමට අවශ්‍ය ලී දඬු ටික, බට ගස් ටික සහ වෙළීම සඳහා ගන්නා බාඳුරා වැල්, පෝටා වැල්, වෙනි වැල් ආදිය ද මාරහේන කැලයෙන් කපා ගෙන එයි. වහලට අවශ්‍ය පරාල, රීප්ප පවා සියල්ල, මුලින් ම එකතු කරගන්නේ ඔහු විසින් ම ය. තනිව ම මාරහේන කැලෑවට රිංගා ගන්නා ඔහු අවශ්‍ය ලී දඬු කපා තනිව ම ගෙය ගොඩනගන ස්ථානයට ගෙන එයි. සාදන ගෙයට අවශ්‍ය වන තරමේ විශාල ලීයක් වුවත් තනිවම ගෙන ඒමට තරම් ශක්තියක් ඔහු සතුව තිබිණි. දිග බර ලීයක් නම් කොනකින් ඔසවා කර තබා කරට සම බර වන සේ ක්‍රමයෙන් කර ඉදිරියට ගෙන ගොස්, ලීය කර මතට ගෙන පොරවේ මිට ලීයට සහ කරට හිර-වෙන්නට තබා ගෙන අවශ්‍ය තැනට පැමිණේ. කර තබා ගන්නා ලීය නිසි තැන පැමිණ අත හරිනවා මිස මග දී මහන්සි ඇරීමක් නැත. මාරහේන කැලයේ යායවල් ලෙස සරුවට හැදී ඇති බට ද කපා මිටි බැඳ කර තබාගෙන එයි. මේ ලෙස ගෙනෙන ලී දඬු ආදිය ගොඩ ගසා ගත් පසු නිවස බැඳීම ආරම්භ කරයි. අත්තිවාරම් කපා ලී කණු අවශ්‍ය ආකාරයට සිටුවා බට බැඳ ගනියි. කටුමැටි ගැසීමට මැටි පාගා ගැනීම, මැටි බෝල කර ගැනීම, බිත්තියට තබා බැඳීම ආදිය සියල්ල ම තනියම කරයි. වහලයේ පොල් අතු සෙවිලි කිරීම දක්වා සියල්ල ම අවසාන කරන ඔහු දිනපතා වරින්වර එතැනට ගොස් සෑදූ නිවස දෙස තරමක් ඈතට වී විනාඩි කිහිපයක් බලා සිටින අයුරු දැක ගත හැකි ය. නිව-සේ අයිතිකරුවන් නිවසේ පදිංචි වන තුරු මෙම නිවස බලාකියා ගන්නා කාර්යය ද ඔහුගෙන් ම නොවරදවා සිදුවේ.




මාරහේන කැලෑවේ තිබූ මාර, නැදුන්, ගිනිකූරු, හොර, දෙල් ආදී ගස්කොළන්වලින් වැඩි හරියක් ලිහිනිස් ආතා ගේ අතින් කැපී ගිය බවට සමහරුන්ගේ කීම බොරුවක් විය නොහැක්කේ ය යි සිතමි.

ඔහු රාත්‍රි කාලයේ බොහෝ රෑ වෙනතුරු, ඉරිදා පොළෙන් ගෙන එන පෝරමේ කවි පොත් මහා හඬින් ශබ්ද නඟා කියවීමෙන් මුළු ගමට ම සාහිත්‍ය රසය බෙදුවේ ය. පොතට කෙළින් අල්ලා ගන්නා ලාම්පු තෙල් කුප්පියේ එළියෙන් ඕනෑ ම පුංචි අකුරක් කියවීමට ඔහුට හැකියාව තිබිණි. ඇඳේ ඇල වී පෝරමේ පොතෙහි පිටුවක් නවාගෙන භූමිතෙල් කුප්පිය කිට්ටුවට අල්ලා රැල් බුරුල් හැර කවි ගායනා කරයි.
කාලගෝල කථාව, යසෝදරාවත, මහා-සොඬ කථාව ආදී වූ පොත් රාශියක් ඔහු ළඟ ඇත. එදිනෙදා වැදගත් පුවත් විස්තර කරමින් පළ කරනු ලබන කවි පොත් සහ කවි කොළ ද අතුර පොළෙන් ගෙනැවිත් ගමට ම පණිවුඩය දීම ඔහුගේ සිරිතයි.
කවි කියන ශබ්දය වටපිටාවේ ඇති සියලු ම ගෙවල් වලට හොඳින් ඇසේ. ඒවා අසා සිටීමට අපි සියල්ලෝ ම පුරුදු වී සිටියෙමු. පෝරමේ කවි පොත මුල් පිටුවේ නම සිට සියල්ල ම අකුරක් අඩු නොමැතිව කියවා අවසන් කරන්නේ අච්චු කන්තෝරුවේ නම සමග අච්චු ගැස්ස වූ අයගේ නම ඇති කොටස ද කියවීමෙන් පසුව ය.

ලිහිනිස් ආතා කාලගෝල කථාව නම් කවි පොත කියවයි. අපි නිවෙස්වල සිට අසා සිටිමු.

ආල වඩයි රන්කඳ මෙන් දුටුවම රූපේ - මන
මාලි වගෙයි සැරසුණු විට වටීවි දීපේ
රාල අගෙයි බෝලෙ වගෙයි කළු මිටි රූපේ - මහ
කෝල මමයි කීවට සිත් නොවන්න කෝපේ

නැද්ද පෙනුණෙ බෑනගෙ හැඩ නුඹෙ දෙගුරුන්ටා-දෑ
වැද්ද හුගක් ඉල්ලුවෙ හෙම නැද්ද බැඳෙන්ටා
නැද්ද ලැජ්ජ අර මිනිහා යන මග යන්ටා - මේ
නොද්ද කිනා ගෑනු අගෙයි උල හිඳුවන්ටා

හාදවෙලා යමන් පණේ හොඳ සැප දෙඤද්ඤද-හොඳ
සේද රෙදිත් පට කම්බා අඳින්ට දෙඤද්ඤද
පෑද සමන් පිනි දියරින් ගත නාවඤද්ඤද - සිත
බේද නොවී ඉන්නා ලෙස පොරොන්දු වෙඤද්ඤද

කාසි මුදල් ඕන පමණ අතේ තබඤද්ඤද - හොඳ
දෝසි ජාති කැවිලි පෙවිලි සාද දෙඤද්ඤද (චිප් බළල
චිප් චිප්. මේ බළල් තඩිය කකුලෙ වෙළෙනව.
බොලා...න් මෙන්න මූව එළියට ඇදල දල දෙර
වහපා....න්)

ලේසි ලේසි වැඩ පමණක් උඹට තබඤද්ඤද - නුඹෙ
නෑසියන්ට ආ දවසක වාසි කරඤද්ඤද
උඹයි මමයි හරි ජෝඩුව දැන් ගැලපෙනවා - අර
කළුයි මිටියි හිමි දුටුවම බඩ දැගලනවා -
උඹෙයි මගෙයි පින පලදුන් දින අද වෙනවා - දැන්
ලලයි ලිලයි උඹ හින්ද මගෙ පණ දෙනවා (හූහ් හූඃ)

කැපෙන්නෙ නැත්නම් පෙම්බරි රූපෙට රූපේ - සැප
විඳින්නෙ කොහොමද දෙන්නා වෙලා මනාපේ
(බොලා...න් ඔන්නෙයෙ තේ උගුරක් දියන්කො. උගුර
ලේ රහ වෙල. ඔන්නොය කූරු පයියත් අරං වරේන්
විටක් කන්න)
උපන්නෙ උඹ මට බාරිය වෙන්නයි දී පේ - සැක
හිතන්නෙ නැතුවම යන්නට වෙයන් මනාපේ

රුවට රුවයි රන් මැදිරියෙ ගිරා මලිත්තේ - එහි
ලොවට හිතයි සිටියෝතින් දිය කෑදැත්තේ
උඹට මමයි මම උඹටයි ඉරණම ඇත්තේ - දැන්
හිතට හොඳයි යමු විගසට අපෙ ගම් පැත්තේ.

මහා ශබ්දයෙන් ඉතාමත් සිත් ගන්නා තාලයට කාලගෝල කථාවේ මෙම කවි කියවන විට පහළ අපේ ගෙදර අය අසා සිටින්නේ ඉතාමත් විනෝදයෙනි. ඉහතින් සඳහන් කළ පරිදි කවියක පදයක් දෙකක් කියා දුංකොළ චුට්ටක්, හුණු ටිකක්, බුලත් කොළයක් ඉල්ලන අවස්ථා ද, යම් කිසිවක් මතක් වී ඒ ගැන එමානෝනා ආච්චිගෙන් විමසන අවස්ථා ද ඇත. මේ අතරතුර ම සමහර විටක බුලත් වංගෙඩියෙන් කැති මිටේ උපක-ාරයෙන් විට කොටන ශබ්දය ද ඇසේ. එමෙන් ම එක් පදයක් දෙකක් කියා සිනා සෙමින් හූ හඬ තලමින් රස විඳින අවස්ථා ද අපට ඇසේ.

එක් දිනක උදේ වරුවේ එකොළහට පමණ ලිහිනිස් ආතා අපේ නිවසට පැමිණ ඉස්තෝප්පුවේ පුටුවක් උඩ සනීපෙට නිදා සිටි පූසා පුටුව ඇලකොට බිමට දමා වාඩි වී කතා කළේ අම්මාට ය.

''කරන්නගොඩ කෙල්ලෙ. මට කහට උගුරක් දියං බං'' අමරසේන මහතාගේ රබර් කට්ටිය කපන අම්මා උදේ පාන්දරින් කිරි කපන්නට ගොස් කිරි කපා අහවර වී කිරි වෑස්සෙන තුරු ගෙදරට පැමිණ දවල් ආහාරය සකසන්නී ය. මේ එවන් අවස්ථාවක් ය. අම්මා බත් උයා අවසන් ය. ලිහිනිස් ආතාට තේ එක ඉල්ලූ වහා ම නොදුන්නොත් කේන්ති යන බව අම්මා දනී. වතුර උණු කර තේ හදා දීමට වේලාවක් නැත.

''ඈ මාමෙ දැන් තේ ඔනෙන්නෙ නෑ. බත් ඉදිල තියෙන්නෙ. බත් ටිකක් ම කමු. '' අම්මා පැවසුවා ය.

''එහෙමද? හොඳයි හෙනන් මට වතුර වීදුරුවක් ගෙනෙන්.''

ආතා අම්මා ගෙන ආ වතුර වීදුරුවෙන් උගුරක් කටට ගෙන බුලත්විට හක්ක සෝද දැම්මේ ය. ඒ සමග ම අම්මා ගෙන ආ බත් පිඟාන කෑවේ පිඟානට කටින් පිඹිමින් රස්නය අඩු කරමින් ය. බත් කා අහවර වී වතුර ද බී බුලත් මඩිස්සලය ඉණෙන් රැගෙන බුලත්විටක් ඒද මට දුන්නේ කෙටීමට ය. මම ද පොල් කට්ටක් ගෙනැවිත් කැති මිටෙන් විට කොටන්නට පටන් ගත්තෙමි. බුලත්විට කොටා අවසන් ව එය පොල් කටුවෙන් හූරා අල්ල මතට දමා ගෙන ආතාට දීම සඳහා ඔහු අසලට ගියෙමි.

ආතා පුටුව උඩ නිදි ය. අත් දෙක දෙපැත්තේ ය. කකුල් දෙක ද දෙපැත්තේ ය. වරින්වර කෙඳිරි ගායි. වරින්වර තිගැස්සෙයි. ඇඟ ගැහෙයි. මේ නින්ද සාමාන්‍ය නින්දක් නොවන බව පොඩි මට ද වැටහේ. මට ඇතිවුණු බිය නිසා අම්මාට කතා කළෙමි. අම්මා පැමිණ බලා ''මාමෙ මොකද මේ?'' යනුවෙන් පවසමින් ඇඟට අත තබා සොලවා ඇසුවත් ආතා කතාවක් නැත. අම්මාට ද බය ය. අම්මා

16 වන පිටට